**පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 437**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
දසවැනි පාර්ලිමේන්තුව
(පළමුවැනි සභාවාරය)

# පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දහහතරවැනි වාර්තාව

(2025.07.23 වැනි දින රාජ්‍ය දැව සංස්ථාව සම්බන්ධයෙන් සිදුකරන ලද පරීක්ෂාව)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති
පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා විසින්
2026 ජනවාරි මස 08 වැනි දින ඉදිරිපත් කරන ලදී

*2026 ජනවාරි මස 08 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරන ලදී*

## <u>දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය</u>
## <u>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සංයුතිය</u>

1. ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා, පා.ම., (සභාපති)
2. ගරු අර්කම් ඉල්යාස් මහතා,පා.ම., ( 2025.05.08 දින සිට)
3. ගරු මනෝ ගනේෂන් මහතා, පා.ම., *(2025.03.21 දින සිට.)*
4. ගරු (නීතිඥ) දයාසිරි ජයසේකර මහතා, පා.ම., *(2025.05.20 දින සිට)*
5. ගරු (නීතිඥ) අර්ජුන සුජීව සේනසිංහ මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
6. ගරු ඩී.වී. චානක මහතා, පා.ම., *( 2025.03.21 දින සිට)*
7. ගරු (නීතිඥ) අනුරාධ ජයරත්න මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
8. ගරු නලීන් බණ්ඩාර ජයමහ මහතා, පා.ම., *( 2025.03.21 දින සිට)*
9. ගරු. එස්.එම් මරික්කාර් මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
10. ගරු මුජිබුර් රහුමාන් මහතා, පා.ම., *(2025.05.20 දින සිට)*
11. ගරු චමින්ද විජේසිරි මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
12. ගරු අබූබකර් අතම්බාවා මහතා, පා.ම., *( 2025.05.08 දින සිට)*
13. ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා, පා.ම.,
14. ගරු (නීතිඥ) නිලන්ති කොට්ටහච්චි මහත්මිය, පා.ම., *(2025.03.21 දින සිට)*
15. ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය, පා.ම.,
16. ගරු දිලිත් ජයවීර මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
17. ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා, පා.ම., *(2025.05.08 දින සිට)*
18. ගරු සුජීව දිසානායක මහතා, පා.ම.,
19. ගරු සුදත් බලගල්ල මහතා, පා.ම.,
20. ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා, පා.ම.,
21. ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
22. ගරු ජගත් මනුවර්ණ මහතා, පා.ම.,
23. ගරු රුවන් මාපලගම මහතා, පා.ම.,
24. ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.,
25. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම.,
26. ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා, පා.ම.,
27. ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යාලිංගම් මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
28. ගරු තිළිණ සමරකෝන් මහතා, පා.ම.,
29. ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා, පා.ම.,
30. ගරු (නීතිඥ) ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය, පා.ම.,
31. ගරු දිනේෂ් හේමන්ත මහතා, පා.ම., *( 2025.03.21 දින සිට)*

**<u>කාරක සභාවේ උපදේශකවරුන්</u>**

- ❖ උපදේශක, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව - සරත් මායාදුන්නේ මහතා
- ❖ උපදේශක, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව - පියසේන රණසිංහ මහතා

**<u>කාරක සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය</u>**

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වත්මන් කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

- ❖ ප්‍රධාන නිලධාරි - එච්. රූපානි ද සොයිසා මිය
- ❖ නියෝජ්‍ය ප්‍රධාන නිලධාරී - එස්. එල්. වික්‍රම මයා
- ❖ පාර්ලිමේන්තු නිලධාරි - ජී. වී. එස්. කේ. කුමාරි මිය
- ❖ පාර්ලිමේන්තු නිලධාරි - අයි. එස්. ගෝමස් මිය
- ❖ පාර්ලිමේන්තු නිලධාරි - ජී. එල්. ඩී. ප්‍රනාන්දු මිය
- ❖ පාර්ලිමේන්තු නිලධාරි - එම්. එන්. පී. පෙරේරා මෙය

**<u>කාරක සභා වාර්තා</u>**

www.parliament.lk යන වෙබ් අඩවියෙන් පහත සඳහන් ගමන් මාර්ගය ඔස්සේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තා බාගත කළ හැක.

www.parliament.lk

↓

සිංහල

↓

පාර්ලිමේන්තුවේ කටයුතු

↓

කාරක සභා

↓

කාරක සභා වාර්තා

**පටුන**


| | | පිටු අංක |
|---|---|---|
| 1. | සභාපතිතුමාගේ සටහන | IV |
| 2. | විධායක සාරාංශය | V |
| 3. | දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දහහතරවැනි වාර්තාව | VI |
| 4. | මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය | 1 |
| 5. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මඟින් පරීක්ෂා කරන ලද ආයතනය- රාජ්‍ය දැව සංස්ථාව | 2-16 |

**<u>සභාපතිතුමාගේ සටහන</u>**

පාර්ලිමේන්තුවේ විශේෂ කාර්යයන් සඳහා වන කාරක සභා යටතේ ස්ථාපිත, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව පරිසර අමාත්‍යාංශය යටතට ගැනෙන රාජ්‍ය දැව සංස්ථාවේ 2022, 2023 වර්ෂවල විගණන වාර්තා පරීක්ෂා කිරීමට සහ එහි වත්මන් කාර්ය සාධනයට අදාළව 2025.07.23 දින සිදු කළ විමර්ශනයේ වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත ප්‍රකාරව 1968 අප්‍රේල් 04 දිනැති අංක 14/796 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් රාජ්‍ය දැව සංස්ථාව පිහිටුවා ඇත. 2023 ජනවාරි 13 දිනැති අංක 2314/48 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් දක්වා ඇති ආයතනයෙහි කාර්යයන් පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය. දැව ආනයනය කිරීමේදී සංස්ථාවෙන් සහතිකයක් ලබා ගැනීම අනිවාර්ය කිරීම, ආපදා කාලවලදී අවදානම් සහිත ගස් ඉවත් කිරීම සම්බන්ධයෙන් අදාළ ආයතන සමග සාකච්ඡා කර සුදුසු පියවර ගැනීම හා දැව අපනයනය ආදී කරුණු සම්බන්ධයෙන් කාරක සභාවේ අවධානය යොමු විය.

අමාත්‍යවරයාගේ නියෝගය සංශෝධනය කර අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සංඛ්‍යාව අදාළ නෛතික ප්‍රතිපාදන හා ආයතනයේ ප්‍රායෝගික අවශ්‍යතාවලට අනුරූප වන පරිදි පත් කිරීම, සංස්ථාවේ සමස්ත කාර්ය භාරය සැලකිල්ලට ගෙන සංයුක්ත සැලසුම් හා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම, ආයතනයේ පවතින විශාල පුරප්පාඩු සංඛ්‍යාව සඳහා, අනියම්/දෛනික පදනමේ සේවය කරන සුදුසුකම් සහිත සේවකයන් එම සුදුසුකම්වලට අදාළ සේවා සඳහා අනුයුක්ත කර ගැනීම, ආයතනය සතු තැන්පතු සංවර්ධනය සඳහා යොදාගැනීම, සංස්ථාවේ තොග කළමනාකරණ පද්ධතිය නිසි කාලයට යාවත්කාලීන කිරීම මෙන්ම ඒ සඳහා සේවකයන් පුහුණු කිරීම සහ බාහිර ආයතනවල සහාය ලබාගෙන ඒ සම්බන්ධ දැනුම ආයතනය තුළ වර්ධනය කිරීම සම්බන්ධයෙන් කාරක සභාවේ අවධානය යොමු විය.

දැව කර්මාන්තයේ ඉල්ලුම හඳුනාගනිමින් එයට ගැළපෙන පරිදි වගා කළ යුතු ගස් වර්ග පිළිබඳව පුරෝකථනය කිරීම, දැව අස්වැන්න නිසි පරිදි ලබා ගැනීම, සංස්ථාව විසින් ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීම පිළිබඳව සළකා බලා අවශ්‍යතාවය මත සේවකයන් බඳවාගැනීම, ගස් හෙලීම, අතු කැපීම ආදී කටයුතු සඳහා දම්වැල් කියත්කරුවන් බඳවාගැනීම, ආයතනයෙන් භාරගන්නා දම්වැල් කියත් පරීක්ෂා කර භාරගැනීමට ක්‍රියාපටිපාටියක් සකස් කිරීම, සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවානියුක්තකයින්ගේ භාර අරමුදල් පනත්වල ප්‍රතිපාදනයන්ට අනුව සංස්ථාව කටයුතු නොකිරීම සහ සංස්ථාව සතු වාහන ලියාපදිංචිය පිළිබඳව ඇති ගැටළු හා ඒවා නිරාකරණය කරගැනීම පිළිබඳව කාරක සභාව සාකච්ඡා කරන ලදී.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යභාරය සාර්ථකව ඉටුකර ගැනීම සඳහා, සාමාජික ගරු මන්ත්‍රීවරුන්ගෙන් ලැබෙන සහායත්, කථානායකතුමා ප්‍රධාන පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලයෙන් සහ කාරක සභාවේ උපදේශකවරු දෙදෙනාගෙන් ලැබෙන සහායත්, භාණ්ඩාගාර නිලධාරීන්ගෙන් සහ ජාතික විගණන කාර්යාලයෙන් ලබා දෙන සහායත් අගය කොට සලකමි.

**වෛද්‍ය නිශාන්ත සමරවීර,**
**සභාපති**
**පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව**

**විධායක සාරාංශය**

2025.07.23 වැනි දින පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් රාජ්‍ය දැව සංස්ථාවේ 2022, 2023 වර්ෂවල විගණකාධිපති වාර්තා සහ එහි වර්තමාන කාර්යසාධනය පිළිබඳව කරුණු පරීක්ෂා කරන ලදී. එහිදී පහත සඳහන් කරුණු සලකා බලන ලදී.

- දැව ආනයනයේදී සංස්ථාවෙන් සහතිකයක් ලබා ගැනීම අනිවාර්ය කිරීම
- ආපදා කාලවලදී අවදානම්සහිත ගස් කපා ඉවත් කිරීම සම්බන්ධයෙන් සුදුසු පියවර ගැනීම
- සංස්ථාව විසින් දැව අපනයනය නිසි පරිදි සිදු කිරීම
- අමාත්‍යවරයාගේ නියෝගය සංශෝධනය කර අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සංඛ්‍යාව අදාළ නෛතික ප්‍රතිපාදන හා ආයතනයේ ප්‍රායෝගික අවශ්‍යතාවලට අනුකූල වන පරිදි පත් කිරීම
- සංස්ථාවේ සමස්ත කාර්ය භාරය සැලකිල්ලට ගෙන සංයුක්ත සැලසුම් හා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම
- සංස්ථාවට අදාළව විවිධ තත්ත්වයන් යටතේ වෙනස් වන ආකාරයේ චක්‍රීය සැලැස්මක් සකස් කිරීම
- ආයතනයේ අනියම්/දෛනික පදනම මත සේවය කරන සුදුසුකම් සහිත සේවකයන් එම සුදුසුකම්වලට අදාළ සේවා සඳහා අනුයුක්ත කිරීම
- ආයතනයේ පිරිවැය වැඩි වීමට හේතු හා පිරිවැය කළමනාකරණය කරන ආකාරය
- ආයතනය සතු තැන්පතු නිසි පරිදි උපයෝජනය කිරීම
- සංස්ථාවේ තොග කළමනාකරණ පද්ධතිය අදාළ කාලයට යාවත්කාලීන කිරීම, ඒ සඳහා සේවකයන් පුහුණු කිරීම සහ බාහිර ආයතනවල සහාය ලබාගෙන ඒ සම්බන්ධ දැනුම ආයතනය තුළ වර්ධනය කිරීම
- දැව පිළිබඳව ජනතාවගේ හා කර්මාන්තයේ ඉල්ලුම හඳුනාගෙන ඒ අනුව වගා කරන ගස් පිළිබඳව තීන්දු ගැනීම හා දැව අස්වැන්න නිසි පරිදි ලබා ගැනීම
- ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා සේවකයන් බඳවාගැනීම හා ආයතනයේ කටයුතු සඳහා දම්වැල් කියත්කරුවන් බඳවාගැනීම
- ආයතනයෙන් භාරගන්නා දම්වැල් කියත් පරීක්ෂා කර භාරගැනීමට ක්‍රියාපටිපාටියක් සකස් කිරීම
- වන අපරාධ දැව සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීම
- සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවානියුක්තකයින්ගේ භාර අරමුදල් පනත්වල ප්‍රතිපාදනයන්ට අනුව සංස්ථාව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් පියවර ගැනීම
- සංස්ථාව සතු වාහන ලියාපදිංචිය පිළිබඳ ගැටළුව නිරාකරණය කිරීම

**දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය**
**පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දහහතරවැනි වාර්තාව**

කාරක සභාව විසින් දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේදී 2025.11.26 දින දක්වා පහත ආයතන පරීක්ෂා කරන ලදී.

| අනු අංකය | කැඳවූ ආයතනය | කාරක සභාව පැවැත් වූ දිනය |
|---|---|---|
| 1. | ජාතික තරුණ සේවා සභාව | 2025.02.18 |
| 2. | ජාතික තරුණ සේවා සභාව | 2025.02.20 |
| 3. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 2025.02.27 |
| 4. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 2025.03.05 |
| 5. | ජාතික ඖෂධ නියාමන අධිකාරිය | 2025.03.12 |
| 6. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 2025.03.27 |
| 7. | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (පුද්) සමාගම | 2025.04.02 |
| 8. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 2025.05.08 |
| 9. | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (පුද්) සමාගම | 2025.05.09 |
| 10. | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | 2025.05.15 |
| 11. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 2025.05.23 |
| 12. | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 2025.06.04 |
| 13. | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 2025.06.20 |
| 14. | මහපොළ භාරකාර අරමුදල | 2025.07.09 |
| 15. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 2025.07.17 |
| 16. | රාජ්‍ය දැව සංස්ථාව | 2025.07.23 |
| 17. | සිවිල් ගුවන් සේවා අධිකාරිය | 2025.08.20 |
| 18. | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 2025.09.10 |
| 19. | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | 2025.09.12 |
| 20. | ලංකා විදුලිබල මණ්ඩලය | 2025.09.24 |
| 21. | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | 2025.10.08 |

| | | |
|---|---|---|
| 22. | ලංකා සතොස ලිමිටඩ් | 2025.10.10 |
| 23. | ලංකා විදුලිබල මණ්ඩලයේ පරීක්ෂණයට අදාළව එල්.ටී.එල්. හෝල්ඩිංස් සමාගම හා එහි පරිපාලිත සමාගම් | 2025.10.24 |
| 24. | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2025.11.19 |
| 25. | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2025.11.26 |

වර්තමානයේ දී, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණය යටතට ගැනෙන, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා අය වැය දෙපාර්තමේන්තුව යටතේ නියාමනය වනු ලබන පොදු ව්‍යාපාර 462 ක් පවතී. (මූලාශ්‍රය: රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව-2025.09.04 දිනට)

ඒ අතරින්, 2025.07.23 වැනි දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පරිසර අමාත්‍යාංශයේ විෂය පථයට අයත් රාජ්‍ය දැව සංස්ථාවේ 2022, 2023 වර්ෂවල විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්යසාධනය පරීක්ෂාවට ලක් කොට කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ මෙම වාර්තාවට අන්තර්ගත කර ඇත.

## <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය</u>

රාජ්‍ය දැව සංස්ථාව විසින් 2022 හා 2023 වර්ෂයන්ට අදාළව ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය පහතින් දක්වා ඇත.

| ආයතනය | වර්ෂය | |
|---|---|---|
| | **2022** | **2023** |
| රාජ්‍ය දැව සංස්ථාව | **තත්ත්වාගණනය කළ මතය** | **තත්ත්වාගණනය කළ මතය** |

<u>විගණන මත වර්ග</u>

**01.** <u>තත්ත්වාගණනය නොකළ මතය</u> **(Unqualified Opinion)**
මූල්‍ය ප්‍රකාශන ආයතනයේ මූල්‍ය තත්ත්වය සාධාරණව ඉදිරිපත් කර ඇති බව

**02.** <u>තත්ත්වාගණනය කළ මතය</u> **(Qualified Opinion)**
වාර්තාවේ සඳහන් කරුණුවලින් වන බලපෑම හැර ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව.

**03.** <u>මතය ව්‍යාචනය කිරීම</u> **(Disclaimer of Opinion)**
ප්‍රමාණවත් හෝ උචිත විගණන සාක්ෂි හඳුනාගැනීමට නොහැකිවීම නිසා ගිණුම් සම්බන්ධව මතයක් ප්‍රකාශ කළ නොහැකි බව.

**04.** <u>අහිතකර මතය **(Adverse Opinion)**</u>
ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව.

## රාජ්‍ය දැව සංස්ථාව
## (පරිසර අමාත්‍යාංශය)

**පරීක්ෂා කරන ලද දිනය - 2025.07.23**

**සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු**

## 01. ආයතන සම්බන්ධ පොදු කරුණු

### 1.1 සංස්ථාවේ කාර්යයන්

ආයතනයෙහි කාර්යයන් ලෙස 2023 ජනවාරි 13 දිනැති අංක 2314/48 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ දක්වා ඇති පහත සඳහන් කාර්යයන් සම්බන්ධයෙන් අවධානය යොමු කළ කාරක සභාව, සංස්ථාව 2024 සහ 2025 වර්ෂවල එම කාර්යයන් 07 ක්‍රියාත්මක කිරීමට අදාළ මෙහෙයුම් කටයුතුවල නිරත වී නොමැති බව නිරීක්ෂණය කළාය.

- දැව ආශ්‍රිත නිමි හා අර්ධ නිමි නිෂ්පාදන අපනයනය කිරීම
- වන සංරක්ෂක ජනරාල්වරයාගේ අනුමැතිය මත, කළුවර දැව ප්‍රධාන දැවය ලෙස යොදා නොගත් සහ නිර්මාණ අලංකරණය සඳහා පමණක් කළුවර දැව යොදාගෙන ඇති ගෘහ භාණ්ඩ අපනයනය කිරීම
- විදේශ ප්‍රදර්ශනාගාර හිමි ව්‍යාපාරික ආයතන සමග එළඹෙන ලද ගිවිසුම් යටතේ ගෘහ භාණ්ඩ අපනයනය කිරීම
- දැව ආනයනය කිරීම
- වේවැල් ආනයනය කිරීම
- වන රෝපණය, වන ප්‍රතිරෝපණය, වන සහ වන වගාවන් විද්‍යානුකූලව පාලනය කිරීම
- දැව භාණ්ඩ, දැවමය ගෘහ භාණ්ඩ හා දැවමය කලාත්මක නිෂ්පාදන පුද්ගලික අංශයෙන් මිල දී ගැනීම හා අලෙවි කිරීම

#### 1.1.1. දැව ආනයනය කිරීමේදී නියාමන කාර්යය

වේවැල් හා දැව ආනයනය කිරීමේ අවශ්‍යතාවය හා දැව ආනයනයේදී නියාමන කාර්යයන් පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

දැව ආනයනයේදී සංස්ථාවෙන් සහතිකයක් ලබා ගැනීම අනිවාර්යය වන ලෙස සංස්ථාවේ පනත සංශෝධනය කර, ඒ පිළිබඳව අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීම සුදුසු බව කාරක සභාව අවධාරණය කළාය.

1.1.2 <u>දැව අපනයනය කිරීම</u>

දැව අපනයනයට අදාළව ආයතනය විසින් ඉටු කළ යුතු පහත සඳහන් කාර්යයන් පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

- දැව ආශ්‍රිත නිමි හා අර්ධ නිමි නිෂ්පාදන අපනයනය කිරීම
- වන සංරක්ෂක ජනරාල්වරයාගේ අනුමැතිය මත, කළුවර දැව ප්‍රධාන දැව ලෙස යොදා නොගත් සහ නිර්මාණ අලංකරණය සඳහා පමණක් කළුවර දැව යොදාගෙන ඇති ගෘහ භාණ්ඩ අපනයනය කිරීම
- විදේශ ප්‍රදර්ශනාගාර හිමි ව්‍යාපාරික ආයතන සමග එළඹෙන ලද ගිවිසුම් යටතේ ගෘහ භාණ්ඩ අපනයනය කිරීම

1.1.3. <u>ආපදා තත්ත්වවලදී ගස් ඉවත් කිරීම</u>

ආපදා කාලවලදී මග දෙපස ඇති ගස් කඩා වැටීමෙන් අනතුරු සිදු වන බවත්, එම ගස් ඉවත් කිරීමට සංස්ථාවේ මැදිහත් වීම අවශ්‍ය වුවද එය ආයතනයේ කාර්යයක් ලෙස දක්වා නොමැති බවත් කාරක සභාවට නිරීක්ෂණය විය.

මෙම කරුණේදී විවිධ ආයතන සම්බන්ධ කර ගැනීමේ අවශ්‍යතාවය ආයතනයේ කාර්යයන්වල දැක්වීම සුදුසු බවත්, ඒ සඳහා ආයතන කිහිපයක් සම්බන්ධ විය යුතු බැවින්, එය සංකීර්ණ කටයුත්තක් බවත්, එම ආයතන සමග සාකච්ඡා කර සුදුසු තීරණයක් ගත යුතු බවත් කාරක සභාව පෙන්වා දුන්නාය.

**<u>කාරක සභාවේ නිර්දේශ</u>**

i. දැව ආනයනයේදී රේගුවේදී අනිවාර්යයෙන් පරීක්ෂා විය යුතු දැව සඳහා පරීක්ෂණ සහතිකයක් සංස්ථාවෙන් ලබා දීමට හැකි වන පරිදි සංස්ථාවේ පනත සංශෝධනය කිරීම.
ii. ආපදා කාලයන්හිදී කඩා වැටීමේ අවදානමක් සහිත ගස් කපා ඉවත් කිරීම සඳහා ඒ හා සම්බන්ධ අනෙකුත් ආයතන සමග ද සාකච්ඡා කර සංස්ථාවට පැවරී ඇති කාර්යයන් නිශ්චය කිරීමට හැකි වන පරිදි පනතට අවශ්‍ය සංශෝධනයන් සිදු කිරීම.

**1.2.** **<u>අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය</u>**

1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කර තිබූ සංස්ථාපිත නියෝගය මඟින් නියම කර ඇති අධ්‍යක්ෂවරුන් 05 ක සංඛ්‍යාවකින් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත විය යුතුය. එම නියෝගයෙහි සඳහන් සාමාජික සංඛ්‍යාව සංශෝධනය කිරීමකින් තොරව සංස්ථාවේ

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සාමාජිකයින් 7 දෙනෙකු පත් කර තිබූ බව කාරක සභාවට අනාවරණය විය.

මෙම ආයතනය වෙළඳ ආයතනයක් බැවින්, කළමනාකරණය, නීති හා දැව ක්ෂේත්‍රවලට අදාළ ප්‍රවීණයන්ගෙන් සැදුම්ලත් අධ්‍යක්ෂ මණ්ඩලයක් සිටීම සුදුසු බව කාරක සභාවට නිරීක්ෂණය විය.

ඉහත කී පනතෙහි 2 (1) (b) (vi) වගන්තිය අනුව සංස්ථාවන්හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සංඛ්‍යාව 03 ට නොඅඩු සහ 07 දෙනෙකුට වැඩි නොවිය යුතු බව සඳහන් වන බවත්, ඊට අදාළ අමාත්‍යවරයාගේ නියෝගයෙහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ සංඛ්‍යාව 05 ක් විය යුතු බව සඳහන් වන බවත්, කාරක සභාවට නිරීක්ෂණය විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. ආයතනයේ අවශ්‍යතාවය හා අභිවෘද්ධිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයන් 07 දෙනෙකුගෙන් සමන්විය යුතු වන්නේ නම්, 1968 අප්‍රේල් 04 දිනැති අංක 14/796 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි පළ කර ඇති අමාත්‍යවරයාගේ නියෝගය සංශෝධනය කර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.
   - එසේ නැතහොත් අමාත්‍යවරයාගේ නියෝගයෙහි සඳහන් පරිදි, සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයන් 05දෙනෙකුට සීමා කිරීමට කටයුතු කිරීම.
   - වර්තමානයේ කටයුතු කරන ලෙස සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සාමාජිකයන් 07දෙනෙකු පත් කරගැනීම සඳහා අමාත්‍යවරයාගේ නියෝගය සංශෝධනය කරගනු ලැබුවහොත්, ආයතනයේ අවශ්‍යතාවයට අනුව අමාත්‍යාංශයේ නියෝජිතයකු හා විවිධ ක්ෂේත්‍රවලට අදාළ සාමාජිකයන් 07දෙනෙකු අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම.

**1.3. <u>ක්‍රියාකාරී සැලැස්ම</u>**

2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යවසායන් සඳහා වූ ආයතනික යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 5 වන පරිච්ඡේදයෙහි 02 වන ඡේදයෙහි ආකෘතිය B ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සංස්ථාවේ අරමුණු ඉටුකරගැනීම සඳහා සම්පූර්ණ කළයුතු උපායමාර්ග හා ක්‍රියාකාරකම් නිශ්චිතව දක්වමින් සහ එම ක්‍රියාකාරකම් සිදුකිරීමේ වගකීම සම්පූර්ණ කිරීමට සහ අපේක්ෂිත මූල්‍ය ඇස්තමේන්තුව සඳහා කාලරාමුවක් සහිතව අදාළ බලධාරින්ට පැවරිය යුතු ආකාරය ඇතුළත්ව සකස් කළ යුතු වුවද, 2023, 2024 සහ 2025 වර්ෂ සඳහා වූ

ක්‍රියාකාරී සැලසුම් ඒ අනුව සකස් කර නොතිබීම හා කඳන්, දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන සහ අලෙවිය සම්බන්ධව අත්පත්කරගත යුතු ඉලක්ක පමණක් ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා තිබීම සම්බන්ධයෙන් කාරක සභාවේ අවධානය යොමු විය.

ආයතනවල සංයුක්ත සැලසුම් බාහිර පාර්ශවයන් විසින් සකස් කිරීම වෙනුවට ආයතනයේ නිලධාරීන් විසින්ම සකස් කිරීම සුදුසු බවත්, සංයුක්ත සැලැස්ම චක්‍රීය සැලැස්මක් (Rolling Plan) ලෙස සකස් වී ඉදිරියට යා යුතු බවත් කාරක සභාව පෙන්වා දුන්නාය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. සංස්ථාවේ කාර්යයන්වලට අදාළ සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි හා සංස්ථාවේ අරමුණුවලට අනුගත වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.
ii. සංස්ථාවට අදාළව විවිධ තත්ත්වයන් යටතේ වෙනස් වන ආකාරයේ චක්‍රීය සංයුක්ත සැලැස්මක් (Rolling Plan) ඉදිරි වර්ෂ 05 සඳහා සකස් කිරීම. (2020-2025 කාලපරිච්ඡේදයට අදාළ සංයුක්ත සැලැස්ම සඳහා 2021-2026, 2022-2027, 2023-2028 ආදී වශයෙන්)

## 1.4. <u>වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම</u>

2023 සහ 2024 වර්ෂවලට අදාළ සංස්ථාවේ වාර්ෂික වාර්තා සභාගත කිරීම පිළිබඳව කාරක සභාව විමසන ලදී.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. 2024 වර්ෂයට අදාළ සංස්ථාවේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කිරීම.
ii. ආයතනයේ මූල්‍ය වාර්තා විගණකාධිපතිවරයා වෙත ලබා දීමේදී සිදු වන ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා කටයුතු කිරීම.

## 1.5. <u>කාර්ය මණ්ඩලය</u>

2025 ජුනි 30 දිනට ආයතනයේ කාර්ය මණ්ඩලය පිළිබඳ පහත තොරතුරු සම්බන්ධයෙන් කාරක සභාවේ අවධානය යොමු විය.

| තනතුරු කාණ්ඩය | අනුමත | සේවක සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|
| | | තත්‍ය | | | පුරප්පාඩු |
| | | ස්ථිර | අනියම් | දෛනික | |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 104 | 64 | - | - | 40 |

| | | | | | |
|---|---|---|---|---|---|
| තෘතියික මට්ටම | 190 | 92 | - | - | 98 |
| ද්විතීයික මට්ටම | 746 | 506 | 11 | 49 | 240 |
| ප්‍රාථමික මට්ටම | 1,268 | 598 | 74 | 158 | 670 |
| එකතුව | 2,308 | 1,260 | 85 | 207 | 1,048 |

සංස්ථාවේ සිටිය යුතු කාර්ය මණ්ඩලයෙන් 50% ක ප්‍රමාණයක් පමණක් සිටින බව මෙන්ම, ද්විතීයික මට්ටමෙහි නිලධාරීන් දෛනික පදනමේ සේවය කිරීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

ආයතනයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පාලන හා මානව සම්පත්) විසින් අත්සන් කොට ලබා දී ඇති ලේඛනයට අනුව, ද්වීතියික පදනමේ තනතුරක් වන කළමනාකරණ සහකාර තනතුරෙහි අනියම් සහ පුරප්පාඩු තනතුරෙහි රාජකාරි ඉටුකරන කොන්ත්‍රාත්/අනියම්/දෛනික සේවක සංඛ්‍යාව යටතේ 60 දෙනෙකු සිටින බව සඳහන් වන බව නිරීක්ෂණය කළ කාරක සභාව, ආයතනයේ පුරප්පාඩු තිබියදී, සුදුසුකම් සහිත සේවකයන් ද්වීතියික බාණ්ඩයේ අනියම් පදනමෙහි තැබීම මඟින්, එම සේවකයන්ට අසාධාරණයක් සිදු වන බවත්, එසේත් නොමැති නම් සුදුසුකම් නොමැති පහළ මට්ටම්වල සේවකයන්, ආයතනයේ ප්‍රාථමික මට්ටමේ ද පුරප්පාඩු තිබියදී, ද්වීතියික බාණ්ඩයේ අනියම් පදනමෙහි තබා රාජකාරී ආවරණයක් සිදු කරන්නේ නම් එය ද වරදක් බවත්, ක්ෂේත්‍ර සහායක, කළමනාකරණ සහකාර, බර යන්ත්‍ර ක්‍රියාකරු, රියදුරු, දම්වැල් කියත්කරු, කාර්යාල සහායක ඇතුළු ආයතනයේ ක්ෂේත්‍ර ගණනාවක අනියම් හා දෛනික පදනමේ රැකියා වල නිරත වී ඇති සේවකයන් 293ක් පමණ සිටින බවත්, අනියම් පදනමේ සේවකයන්ට නොගැළපෙන කාර්යභාරයක් පැවරීම නුසුදුසු බවත්, අනියම්/ දෛනික පදනමේ කටයුතු කරන රියදුරු වැනි තනතුරුවල සේවකයන්ට රැකියා පැවරීමේදී විශේෂයෙන් සැළකිලිමත් විය යුතු බවත් අවධාරණය කළාය.

සංස්ථාවේ ද්විතීයික මට්ටමේ තනතුරු 01 ක් සඳහා අනියම් පදනමින් සේවකයින් 11ක්ද දෛනික පදනමින් සේවකයින් 49 ක්ද ලෙස සේවකයින් 60 ක් ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 13 ක් සඳහා අනියම් පදනමින් සේවකයින් 74 ක් සහ දෛනික පදනමින් සේවකයින් 158 ක් ලෙස සේවකයින් 232 ක් ද සේවයේ යොදවා තිබූ බවත්, මේ තුළ වර්ෂ 4-11 දක්වා සේවයේ යෙදී සිටින සේවකයින් 136 ක් ද වූ බවත්, සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 11 ක්, තෘතීක මට්ටමේ තනතුරු 7 ක්, ද්විතීක මට්ටමේ තනතුරු 6ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 6 ක් සඳහා වැඩ බැලීමේ පදනම මත නිලධාරීන් 43 ක් ද, රාජකාරි ඉටු කිරීමේ පදනම මත

නිලධාරීන් 22 ක් ද ලෙස නිලධාරීන් 65 දෙනෙක් 2019 සිට 2025 වර්ෂය දක්වා වරින් වර පත් කර තිබූ බවත්, වැඩ බැලීමේ රාජකාරිවල නිරත නිලධාරීන් 16 ක් සඳහා රු.4,921,210 ක් ද, රාජකාරි ඉටු කිරීමේ නිරත නිලධාරීන් 14 ක් සඳහා රු.3,395,731 ක් ද, වශයෙන් එකතුව රු.8,316,941 ක් 2025 මැයි 31 දක්වා ගෙවීම් කර තිබූ බවත් කාරක සභාවට හෙළි විය.

එමෙන්ම, 2025 ජුනි 30 දිනට අනුමත තනතුරු 81 ක පුරප්පාඩු 1,048 ක් පැවති බවත්, අනුමත නොවූ තනතුරු 09 කට ස්ථිර පදනම මත තෘතීයික මට්ටමට සේවකයින් 11 ක් සහ ප්‍රාථමික මට්ටමට 7 ක් ලෙස එකතුව 18 ක් ද කොන්ත්‍රාත් පදනමින් තෘතීයික මට්ටමට එක් සේවකයෙක්ද බඳවාගෙන තිබූ බවත්, ආයතනයේ ක්ෂේත්‍ර නිලධාරීන් 120ක් පමණක් සේවය කරන බැවින්, තවත් ක්ෂේත්‍ර නිලධාරීන් බඳවාගැනීමේ අවශ්‍යතාවයත්, එමෙන්ම ඔවුන්ගේ යතුරුපැදි සඳහා දැනට ලබා දෙන ඉන්ධන ප්‍රමාණය වැඩි කිරීම සුදුසු බවත් කාරක සභාවට නිරීක්ෂණය විය.

සංස්ථාවේ අනියම්/දෛනික පදනම මත සේවය කරන සේවකයන්ට පැවරන කාර්යභාරය බඳවා ගැනීමේ පදනමට ගැළපෙන ලෙස පැවරීමත්, ආයතනයේ විශාල පුරප්පාඩු සංඛ්‍යාවක් පවතින බැවින්, අනියම්/දෛනික පදනමේ සේවය කරන සුදුසුකම් සහිත සේවකයන් එම සුදුසුකම්වලට අදාළ සේවා සඳහා ස්ථිර ලෙස අනුයුක්ත කර ගැනීම සඳහා මැදිහත් වීමත්, අනියම් හා දෛනික තනතුරුද ඇතුළත්ව, සේවක සංඛ්‍යාවේ තනතුරු වර්ගීකරණයක් සිදු කර, කාරක සභාවට වාර්තා කරන ලෙසත්, ආයතනයේ අනුමත නොවූ තනතුරු සඳහා සේවකයන් බඳවා ගැනීමට අදාළව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හා අග්‍රාමාත්‍ය ලේකම් ප්‍රමුඛ බඳවාගැනීම් සම්බන්ධ කමිටුවට වාර්තා කර සුදුසු පියවර ගෙන කාරක සභාවට වාර්තා කරන ලෙසත්, ආයතනයේ දෛනික හා එක් දින සේවකයන් ස්ථිර කිරීමට අදාළ කටයුතු සිදු කිරීමත්, මේ සම්බන්ධයෙන් ලබා ගත් පියවර පිළිබඳව විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට වාර්තා කරන ලෙසටත් කරන ලද නිර්දේශවලට අනුව, මේ සම්බන්ධයෙන් ගෙන ඇති පියවර ඇතුළත් වාර්තාවක් පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2025.09.10 දිනැති ලිපිය මගින් කරක සභාවට වාර්තා කර ඇත.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. ක්ෂේත්‍ර නිලධාරීන්ට ලබා දී ඇති යතුරුපැදි සඳහා ලබා දෙන ඉන්ධන ප්‍රමාණය වැඩි කර ගැනීම සඳහා ඇති ඉල්ලීම නිරාකරණය කිරීමට කටයුතු කිරීම.

ii. ආයතනය සතු දම්වැල් කියත් ක්‍රියාත්මක කිරීම සඳහා දෛනික පදනම මත අවශ්‍ය කාලයට පමණක් සේවකයන් බඳවාගැනීමට ඇති හැකියාව පිළිබඳව සොයා බලා සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීම.

## 1.6. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

ආයතනයේ 2021 සිට 2024 දක්වා වර්ෂ 4 ක මෙහෙයුම් කාර්යසාධනයට අදාළ තොරතුරු මූල්‍ය ප්‍රකාශන අනුව පෙනී යන බව අවධානය යොමු කළ කාරක සභාව, 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ආයතනයේ විකුණුම් ආදායම අඩු වී, මුළු වියදම වැඩි වීම පිළිබඳව නිරීක්ෂණය කළාය.

2024 වර්ෂය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් රාජ්‍ය දැව සංස්ථාව වෙත ලබා දුන් වන වගාවල මෙහෙයුම් ප්‍රගතිය පිළිබඳ වාර්තාවට අනුව, 2021 වර්ෂයට අදාළ නිල්දන්ඩාහින්න ප්‍රදේශයට අයත් ගස් හෙළීම සම්බන්ධයෙන් වන දත්ත කාරක සභාව විසින් දක්වන ලද අතර ඒ අනුව, මෙම වත්තෙහි 5% ක පමණ ප්‍රමාණයක ගස් හෙළීම් කර ඇති බවත්, එයට ආයතනයේ ක්‍රියාකාරීත්වය බලපා ඇති බව පෙනී යන බවත්, ආයතනයට ලැබී ඇති ගස් ප්‍රමාණයද හෙළීම් කර නොමැති බවත් නිරීක්ෂණය විය.

අලෙවිකරණය සම්බන්ධයෙන් ආයතනය අවධානය යොමු කළ යුතු බව කාරක සභාව අවධාරණය කළාය.

මේ වන විට ආයතනයේ රු. මිලියන 5,700ක ප්‍රමාණයක තැන්පතු තිබෙන බව, අනාවරණය වූ අතර, මෙය බදු හා භාණ්ඩාගාර ප්‍රේෂණවලට පසු ලාභය ලෙස සඳහන් වන බවත්, එය ආයතනයේ සංවර්ධනයට භාවිතා කරන ලෙසත් කාරක සභාව අවධාරණය කළාය.

**කාරක සභාවේ නිර්දේශ**

i. ආයතනයට ලැබෙන විවිධ වර්ගයේ දැවවලින් දැව අස්වැන්න (harvest) ලබා ගැනීම වැඩි කර ගැනීමට පියවර ගැනීම.

ii. ආයතනයේ පිරිවැය වැඩි වීමට හේතු අධ්‍යයනය කොට, පිරිවැය කළමනාකරණය කිරීම සඳහා කටයුතු කිරීම.

## 1.7 ආයතනයේ ස්ථාපිත කරන ලද තොග කළමනාකරණ පද්ධතිය වර්තමානයේදී ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබීම.

ආයතනයේ යම්කිසි දිනකට තොග ශේෂය, නිෂ්පාදනය, අලෙවිය සහ වෙනත් අංශවලට මාරුකිරීම් වැනි තොරතුරු ලබා ගැනීමට හැකිවන පරිදි තොග

කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කර තිබුණද, වර්තමානයේදී එය ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණු බව නිරීක්ෂණය වූ බැවින් මෙම පද්ධතියේ ඇති දෝෂය පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

මේ සම්බන්ධයෙන් කාරක සභාවේ නිරීක්ෂණ පහත පරිදි වේ.

- පද්ධතිය නැවත යථා තත්ත්වයට පත් කළ හැකිද යන්න පරීක්ෂා කිරීමට විශේෂඥයන් යොදවා අධ්‍යයනයක් සිදු කර, එය යථා තත්ත්වයට පත් කළ හැකිද, නැතහොත් නව පද්ධතියක් නිර්මාණය කළ යුතුද යන්න පිළිබඳව තීරණයක් ගෙන, ඒ සඳහා අපේක්ෂිත පිරිවැය ගණනය කිරීමක් සිදු කළ යුතු බව,
- ආයතනයේ තොරතුරු තාක්ෂණ අංශයට දත්ත ඇතුළත් කිරීමට අදාළ කාර්ය භාරය පමණක් අවසානයේදී සිදු කිරීමට ඇති බැවින් තොරතුරු තාක්ෂණ අංශයේ අවශ්‍යතාවයක් නොමැති බව,
- මෙම ආයතනයේ තොරතුරු තාක්ෂණ අංශයේ ඇති ගැටළුව සියලු රාජ්‍ය ආයතනවලට පොදු කරුණක් බවට ප්‍රකාශ කිරීම නුසුදුසු බව,
- මෙවැනි පද්ධති සුදුසු කාලයට යාවත්කාලීන විය යුතු බැවින් ඒ සඳහා පුහුණු සේවකයන් ආයතනය තුළ නොමැති නම් සේවකයන් පුහුණු කළ යුතු බව,
- මේ සම්බන්ධයෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පාලන හා මානව සම්පත්)ට වගකීමක් තිබෙන බව,
- සාමාන්‍යයෙන් අප රටෙහි ආයනතවල නව පද්ධති නිර්මාණය කිරීමේදී, වෙනත් ආයතනයකින් ඒ සඳහා සහාය ලබාගෙන, එය ක්‍රියාත්මක කිරීමට හා පවත්වාගෙන යාමට අදාළ දැනුම ආයතනයේ සේවකයන්ට බාහිර ආයතනය විසින් ලබා දෙන බව,
- පද්ධතියේ අනුවාද (versions) වෙනස් වීමේදී එයට අදාළ පුහුණුව ද ආයතනයේ නිලධාරීන් වෙත අදාළ බාහිර සමාගම විසින් ලබා දෙන බව,
- සාමාන්‍යයෙන් එක් සර්වරයක් (server) ක්‍රියාවිරහිත නම් තවත් සර්වරයක් (server) මේ සඳහා තිබිය යුතු බව,
- ආයතනයේ සමහර නිලධාරීන් විසින් පරස්පර විරෝධී ප්‍රකාශ සිදු කරන බව හා මේ සම්බන්ධයෙන් ලබා දී ඇති පිළිතුරු පිළිබඳව සෑහීමට පත් නොවන බව.

තොරතුරු පද්ධතිය ගොඩනැගීම පිළිබඳ ප්‍රගතිය හා පද්ධතියේ තිබූ දත්ත පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට ලබා දෙන ලද නිර්දේශය පරිදි, පරිසර අමාත්‍යාංශයේ ලේකම්ගේ 2025.09.10 දිනැති ලිපිය සමග ඉදිරිපත්

කර ඇති රාජ්‍ය දැව සංස්ථාවේ සභාපතිගේ 2025.08.18 දිනැති මගින් තොග කළමනාකරණ පද්ධතිය නැවත සකස් කිරීම සඳහා දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග සහ පැවති පද්ධතියේ තිබූ දත්ත පිළිබඳව සම්පූර්ණ තොරතුරු ඇතුළත් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

**<u>කාරක සභාවේ නිර්දේශ</u>**

i. රාජ්‍ය දැව සංස්ථාවේ සභාපතිගේ උක්ත ලිපියේ සඳහන් පරිදි දත්ත පද්ධතිය නොපමාව ස්ථාපිත කිරීම.

**02. <u>2022 අප්‍රේල් 22 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය</u>**

**2.1. <u>නිර්දේශ අංක 09</u>**

**<u>මහනුවර වැලිගම්පොල හයින්ෆෝඩ් වත්ත නැමැති ඉඩමෙන් පයිනස් ගස් කපා ඉවත් කර ගැනීම</u>**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2020 ජුනි 30 දින මහනුවර වැලිගම්පොල හයින්ෆෝඩ් වත්ත නැමැති ඉඩමෙන් පයිනස් ගස් 28,958 ක් කපා ඉවත් කර ගැනීම සඳහා දැව සංස්ථාවට භාර දී තිබුණද, 2022 මාර්තු 30 වන විටත් එම ගස් කපා ඉවත් කර නොගැනීමට අදාළව, විශේෂ රැස්වීමක් කැඳවා සාකච්ඡා කිරීමටත්, පයිනස් අපනයනය කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ එක්ව සකස් කර මාස 2 ක් ඇතුළත කාරක සභාව වෙත ලබා දීමටත්, නැවත වගා කිරීමේ වැඩපිළිවෙලක් ආරම්භ කිරීම සහ එය ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමටත්, එම සැලැස්මට කාල රාමුවක්ද ඇතුළත් කර එම කාල පරාසය තුළ සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වන කාර්යයන්ද ඇතුළත් කිරීමටත් අදාළව, කාරක සභාව විසින් නිර්දේශ කර ඇති නමුත්, 2025 ජුනි වන විටත් ගස් ඉවත් කිරීම, පයිනස් අපනයනය කිරීමට ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම, හා නැවත වන වගා කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීම යන කරුණු සිදු කර නොතිබීම පිළිබඳ කාරක සභාවේ අවධානය යොමු විය.

**<u>කාරක සභාවේ නිර්දේශ</u>**

i. දැව සම්බන්ධයෙන් මහජනයාගේ ඉල්ලුම පිළිබඳව සැළකිලිමත් වී, ඒ අනුව ආයතනයේ මෙහෙයුම් සකස් කර ගැනීම.

## 2.2 <u>නිර්දේශ අංක 16</u>

<u>**වා ලංකා ආයතනයෙන් අයවී නොමැති ශේෂය කපාහැර තිබීම**</u>

වා ලංකා ආයතනයෙන් අයවී නොමැති රු.මිලියන 11.87 ක ශේෂය සම්බන්ධව අමාත්‍යාංශ ලේකම් හරහා භාණ්ඩාගාර ලේකම්ට දැනුම් දී නිසි අවසරයකින් යුතුව මෙම ගනුදෙනුව අවසන් කිරීමට කාරක සභාව විසින් ප්‍රධාන ගණන් දීමේ නිලධාරීට සහ ගණන්දීමේ නිලධාරීට නිර්දේශ කර ඇති බවත්, 2022.11.14 දිනැති රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතේ 6.9 උපදේශය පරිදි කටයුතු කරන ලෙස දන්වා තිබුණද, ඒ අනුව කටයුතු නොකර එම ශේෂය කපාහැර තිබූ බවත් කාරක සභාවට හෙළි විය.

මේ සම්බන්ධයෙන් ඇති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය හා විගණන හා කළමනාකරණ කමිටුවේ නිරීක්ෂණ සංස්ථාව විසින් ඉදිරිපත් කර ඇති නමුත්, අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කර නොමැති බැවින්, එය විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු බව කාරක සභාව අවධාරණය කළාය.

<u>**කාරක සභාවේ නිර්දේශ**</u>

i. මෙම කරුණට අදාළ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව, අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අදාළ තොරතුරු හා විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශ ඇතුළත් වාර්තාවක් විගණනයට හා කාරක සභාවට ඉදිරිපත් කිරීම.

## 2.3 <u>නිර්දේශ අංක 20</u>

<u>**අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව පමණක් රාජ්‍ය දැව සංස්ථාවේ හිටපු සභාපතිවරයෙකුගේ සහායට උපදේශකවරු දෙදෙනෙකු සහ රියදුරෙකු බඳවාගැනීම සහ ඔවුන්ට 2019 වර්ෂයේ දින 270 ක් සඳහා රු. 769,500 ක් ගෙවා තිබීම**</u>

අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව පමණක් රාජ්‍ය දැව සංස්ථාවේ හිටපු සභාපතිවරයෙකුගේ සහායට උපදේශකවරු දෙදෙනෙකු සහ රියදුරෙකු බඳවාගෙන ඔවුන්ට 2019 පෙබරවාරි 12 සිට සැප්තැම්බර් 3 දක්වා දිනකට රු.2,850 බැගින් දින 270 කට රු.769,500 ක් ගෙවා තිබීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ සහ ආයතනයේ නීති නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් නීතිපති සමඟ සාකච්ඡාවක් පවත්වා මෙම බඳවා ගැනීමට අනුමැතිය ලබා දුන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලෙස කාරක සභාව විසින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීට නිර්දේශ කරන ලද බව කාරක සභාවට නිරීක්ෂණය විය.

එමෙන්ම, මෙම ප්‍රශ්නගත බඳවාගැනීම සහ ගෙවීම සම්බන්ධව විමර්ශන කටයුත්තක් සිදු කිරීමෙන් තොරව නඩු පැවරීමේ හැකියාව සළකා බැලීම සිදු කළ නොහැකි බව දක්වා, විමර්ශනයක් කිරීමට හැකිවන පරිදි පොලීසියට පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලෙස අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් ලබා දී තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණු බව කාරක සභාවට හෙළි විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. මෙම නිර්දේශය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ආයතනයේ ප්‍රමාදයක් නිරීක්ෂණය වන බැවින් නොපමාව ඉදිරි කටයුතු සිදු කිරීම.
ii. සේවකයන් බඳවා ගැනීම පිළිබඳව මින් ඉදිරියට නියාමනයක් කිරීම.

**2.4 <u>නිර්දේශ අංක 22</u>**

<u>බූස්ස දැව ගබඩා භූමියෙහි ගොඩ ගසා පවතින කළුවර කඳන් පිළිබඳ යාවත්කාලීන දත්ත ලබා ගැනීම සඳහා සංස්ථාවේ පවතින තොග කළමනාකරණ පද්ධතිය නඩත්තු කර නොතිබීම</u>

2007 වර්ෂයේ සිට බූස්ස දැව ගබඩා භූමියෙහි ගොඩ ගසා තිබෙන වටිනාකම රු.මිලියන 47 ක් වූ කළුවර කඳන් ස.ඝ.මීටර් 225,994 ක තොගය අමාත්‍යාංශ ලේකම්ගේ අධීක්ෂණය යටතේ විකිණීමට ප්‍රධාන ගණන්දිමේ නිලධාරීට කාරක සභාව විසින් නිර්දේශ කර ඇති බවත්, 2025 ජුනි 30 දිනට බූස්ස දැව ගබඩාවේ පැවති කළුවර දැව කඳන් තොගය ස.ඝ.මීටර් 85,073 ක් වූ බවත්, එසේ වුවද නිර්දේශයේ සඳහන් දැව තොගය විකුණා තිබේද, සංස්ථාවේ වෙනත් නිෂ්පාදන අංශවලට මාරුකර තිබේද යන්න තහවුරු කර ගැනීම සංස්ථාවේ පවතින තොග කළමනාකරණ පද්ධතිය නඩත්තු නොකිරීමේ හේතුවෙන් නොහැකි වී ඇති බව කාරක සභාවට අනාවරණය විය.

මෙම තොරතුරු පද්ධතිය ගොඩනැගීම හා පද්ධතියේ තිබූ දත්ත පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් බව කාරක සභාවේ අදහස විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. මෙම කළුවර දැව කඳන් පිළිබඳ සිදුවූයේ කුමක්ද යන්න පිළිබඳව සියලු තොරතුරු ඇතුළත් වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කිරීම.

## 03. 2022 සහ 2023 වර්ෂවල විගණකාධිපති වාර්තාවලට අදාළව සාකච්ඡා කළ කරුණු

### 3.1. වන අපරාධ දැව සම්බන්ධයෙන් අධිකරණ නියෝගයක් ලැබෙනතුරු කටයුතු කිරීමට නොහැකි වීම හේතුවෙන්, වන අපරාධ දැවවලට වී ඇති හානිය

2018 ඔක්තෝබර් 10 දිනැති අංක 422 දරන අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛයේ ප්‍රතිපාදනවලට අනුව වන අපරාධ දැව සම්බන්ධයෙන් අධිකරණ නියෝගයක් ලැබෙනතුරු කටයුතු කිරීමට නොහැකි වීම හේතුවෙන්, වන අපරාධ දැව විනාශ වීම, දැව කළමනාකරණය හා ගබඩා පහසුකම් කළමනාකරණය කර ගැනීම අපහසු වීම වැනි අසීරුතාවලට සංස්ථාව මුහුණ පා සිටින බවත්, මහනුවර ප්‍රාදේශිකයට අදාළව පමණක් දැව කඳන් ස.ඝ.මීටර් 159,904 ක් සහ ඉරූ දැව ස.ඝ.මීටර් 30,933 ක් දිරාපත් වෙමින් ද, ගබඩා ඉඩ පහසුකම් ඇහිරී ගොස් ද තිබුණු බවත් විගණනයට නිරීක්ෂණය වී ඇත. 2024 දෙසැම්බර් 31 දිනට මහනුවර ප්‍රාදේශිකයේ පැවති ඉතිරි දැව කඳන් තොගය ස.ඝ.මීටර් 61,320 ක් වීම පිළිබඳවත් සහ ඉරූ දැව තොගය ස.ඝ.මීටර් 17,039 ක් වීම පිළිබඳවත් කාරක සභාව අවධානය යොමු කළාය.

සංස්ථාවේ ගබඩාවල ඇති ලී දිරා පත්වීම් ආදී ගැටළු සඳහන් කර සාධාරණීකරණයක් සහිත ඉල්ලීම් අධිකරණයට ඉදිරිපත් කර මෙම ගැටළු නිරාකරණයට කටයුතු කිරීම සුදුසු බව කාරක සභාව අවධාරණය කළාය.

**කාරක සභාවේ නිර්දේශ**

i. අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති ඉහත කී චක්‍රලේඛය අනුව අධිකරණයට ඉල්ලීම් කර මෙම විනාශය අවම කරගැනීමට කටයුතු කිරීම.

## 04. වර්තමාන කාර්ය සාධනයට අදාළව සාකච්ඡා කළ කරුණු

### 4.1 බූස්ස නිෂ්පාදනාගාරයෙහි ගෘහභාණ්ඩ නිෂ්පාදනය

2024 දෙසැම්බර් 31 දිනට බූස්ස නිෂ්පාදනාගාරයෙහි පැවති රු.20,412,522 ක් වූ කෙරීගෙන යන වැඩ තුළ 2011 වර්ෂයේ සිට පැවත එන නොනිමි තොග පැවතුණු බවත්, මෙම නිෂ්පාදනාගාර සංකීර්ණයේ ගෘහභාන්ඩ නිෂ්පාදනය කෙටි වැඩ ගිවිසුම් මත බාහිර කොන්ත්‍රාත්කරුවන් මගින් ඉටුකරවා ගන්නා බවත්, එක් කාර්යක් නිම කිරිමට පෙර නැවත නැවත කාර්යයන් ලබාදී ඒ වෙනුවෙන් 2024.12.31 දිනට කොන්ත්‍රාත්කරුවන් 26ක් වෙත කොටස් මුදල් වශයෙන් රු.11,435.700ක් ගෙවා තිබුණු බවත් කාරක සභාවට හෙළි විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. ආයතනයේ කාර්ය මණ්ඩලය හිඟ බැවින්, ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීම පිළිබඳවද සළකා බලා ඒ සඳහා පුද්ගලයින් බඳවාගැනීමට ඇති හැකියාව පිළිබඳව සළකා බැලීම.

**4.2 <u>සංස්ථාවේ ගෘහභාණ්ඩ නිෂ්පාදන සහ අලෙවි ක්‍රියාවලියේදී දිගින් දිගටම අලාභයන් වාර්තා වීම</u>**

වාර්ෂික විකුණුම් අවශ්‍යතාවය අනුව නිෂ්පාදන අවශ්‍යතාවය පුරෝකථනය නොකිරීම නිසා බූස්ස නිෂ්පාදනාගාරයේ 2023 දෙසැම්බර් 31 දිනට පැවති රු.76,113,771 ක් වූ ගෘහ භාණ්ඩ අයිතම 428 කින් එක් ගෘහ භාණ්ඩයක් හෝ 2025 ජුනි 30 දින වන විටත් අලෙවි වී නොතිබුණු බවත්, සංස්ථාවේ ගෘහභාණ්ඩ නිෂ්පාදන සහ අලෙවි ක්‍රියාවලියේදී පහත පරිදි දිගින් දිගටම අලාභයන් වාර්තා වී තිබුණු නමුත්, එය ලාභදායී මට්ටමකට ගෙන ඒම සඳහා ද සංස්ථාවේ අවධානය යොමු වී නොතිබුණු බවත් කාරක සභාවට නිරීක්ෂණය විය.

| | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|
| ගෘහ භාණ්ඩ නිෂ්පාදන හා අලෙවි අලාභය (රු.මිලියන) | 20.0 | 95.6 | 72.1 | 75.6 |

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. මෙම දැව වෙනත් ගෘහ භාණ්ඩ නිෂ්පාදකයන් හරහා නිර්මාණය කර විකිණීම සඳහා සැලැස්මක් සකස් කිරීම.

**4.3 <u>ආයතනය සතු දම්වැල් කියත් භාවිතයට නොගැනීම හා ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම තාවකාලිකව අත්හිටුවා තිබියදී නව දම්වැල් කියත් 100 ක් මිලදී ගැනීම</u>**

අධිකරණ ක්‍රියාවලිය විසින් රාජසන්තක කර සංස්ථාවට භාරදී ඇති දම්වැල් කියත් ද ඇතුළුව මුළු දම්වැල් කියත් 814 ක් 2022 පෙබරවාරි වන විට සංස්ථාව සතුව පැවතිය දී සංස්ථාව විසින් 2021 සහ 2022 වර්ෂවල පූර්ණ හෙළීම්වලින් 97% ක් සහ වන අපරාධ හා පරිත්‍යාග දැව ඉවත් කිරීම් වලින් 85% ක් කොන්ත්‍රාත්කරුවන් මඟින් සිදු කර තිබුණු අතර, සංස්ථාවේ කලාප මට්ටමින් කියත් 19 ක අවශ්‍යතාවයක් පමණක් දක්වා තිබියදී ඒ පිළිබඳව සැලකිල්ලට නොගෙන වන වගා හෙළීම්, තුනී කිරීම් හා අනතුරුදායක ගස් ඉවත් කිරීම් කටයුතු සඳහා දම්වැල් කියත් 200 ක අවශ්‍යතාවයක් පවතින බව දක්වා අමාත්‍ය මණ්ඩලය වෙත තොරතුරු ඉදිරිපත් කර, ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම තාවකාලිකව අත්හිටුවා තිබියදී 2023 වර්ෂයේදී රු.35,800,080 කට

(වැට් බදු සහිතව) දම්වැල් කියත් 100 ක් මිලදීගෙන තිබුණු බවත්, ඉහත අවශ්‍යතාවය වෙනුවෙන් දම්වැල් කියත් මිලදී ගෙන තිබුණද පූර්ණ හෙලීම් කටයුතු සහ පරිත්‍යාග දැව ඉවත් කිරීම සඳහා 2023 වර්ෂයේදී රු572,434,969 ක්ද 2024 වර්ෂයේදී රු435,526,258 ක් ද කොන්ත්‍රාත් කරුවන් වෙත ගෙවා තිබුණු බවත්, දම්වැල් කියත් ක්‍රියාකරු තනතුර සඳහා අනුමත සේවක සංඛ්‍යාව 40 ක්ද 2025 ජුනි 30 දිනට තථ්‍ය සේවක සංඛ්‍යාව 23 ක් වූ බවත්, ඒ තුළ අනියම් සහ දෛනික සේවකයින් 7 දෙනෙකු ද සේවයේ යොදවා තිබුණු බවත් කාරක සභාවට අනාවරණය විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. දම්වැල් කියත් ක්‍රියාත්මක කිරීම සඳහා දෛනික පදනම මත අවශ්‍ය කාලයට පමණක් සේවකයන් බඳවාගැනීමට ඇති හැකියාව පිළිබඳව සොයා බැලීම.
ii. ආයතනය සතු දම්වැල් කියත් වැඩ කරන තත්ත්වයේ පවතින්නේ ද යන්න පරීක්ෂා කිරීමට තාක්ෂණික දැනුම ඇති පිරිසක් යොදවා තාක්ෂණික ඇගයීමක් සිදු කර කාරක සභාවට වාර්තාවක් ලබා දීම.
iii. ආයතනය සතු දම්වැල් කියත්වලින් වැඩ කරන තත්ත්වයේ නොපවතින ඒවා ඉන්වෙන්ට්‍රිවලින් ඉවත් කර, ඒවා සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.
iv. ආයතනය සතු උපකරණ පිළිබඳ වාර්ෂික තාක්ෂණික ඇගයීමක් සිදු කිරීම.

**4.4 <u>සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවානියුක්තකයින්ගේ භාර අරමුදල් පනත්වල ප්‍රතිපාදනයන්ට අනුව සංස්ථාව කටයුතු නොකිරීම හේතුවෙන් ආයතනයට අලාභයක් සිදු වීම.</u>**

1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් (සංශෝධිත) පනත සහ 1980 අංක 46 දරන සේවානියුක්තකයින්ගේ භාර අරමුදල් පනත්වල ප්‍රතිපාදනයන්ට අනුව සංස්ථාව කටයුතු නොකිරීම හේතුවෙන් 2006 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලයට අදාළව එම අරමුදල්වලට අධිභාර වශයෙන් රු.122,181,576 ක් සහ සේවකයන් විසින් ගෙවිය යුතු දායක මුදල් රු.126,782,058 ක් සංස්ථාව විසින් ගෙවීම නිසා සංස්ථාවට රු.248,963,634 ක අලාභයක් සිදුවී තිබුණු බවත්, ආයතනයේ මුදල් තිබියදී, සේවක අර්ථසාධක අරමුදලට අදාළ මුදල් නියමිත දිනට ප්‍රේෂණය කර නොමැති වීම නිසා මෙම අධිභාරය නියම කිරීමට හේතු වී ඇති බවත් කාරක සභාවට නිරීක්ෂණය විය.

මේ පිළිබඳව සියලු තොරතුරු ඇතුළත් සම්පූර්ණ වාර්තාවක් සතියක් ඇතුළත කාරක සභාවට ඉදිරිපත් කරන ලෙසට ලබා දෙන ලද නිර්දේශයට අනුව, සංස්ථාවේ

සාමාන්‍යාධිකාරී විසින් 2025.08.29 දිනැතිව ඉදිරිපත් කර ඇති වාර්තාව පරිසර අමාත්‍යාංශයේ ලේකම්ගේ 2025.09.10 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත යොමු කර ඇත.

## 4.5. සංස්ථාව සතු වාහන ලියාපදිංචිය පිළිබඳ ගැටළුව

සංස්ථාවේ මූල්‍ය අංශයේ පැවති වාහන ලේඛනයට අනුව සංස්ථාව සතුව පවතින වාහන සංඛ්‍යාව 547 ක් වුවත් සභාපති නමින්, සංස්ථාවේ නමින්, සංස්ථාවේ ලිපිනයට, සංස්ථාවේ කලාප කාර්යාල සහ නිල නිවාසවල ලිපිනයන්ට මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කර තිබූ වාහන සංඛ්‍යාව 563 ක් වූ බවත්, ඒ අනුව වාහන 429 ක් ආයතන 2 හිම ලියාපදිංචි වී ඇති බව තහවුරු වී ඇති බවත් කාරක සභාවට අනාවරණය විය.

තවද, සංස්ථා වාහන ලේඛනයේ පවතින නමුත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ලේඛනයේ නොමැති වාහන 116 ක් පැවතුණු බවත්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ලේඛනයේ පවතින නමුත් සංස්ථාවේ වාහන ලේඛනයේ නොමැති වාහන 134 ක් වූ බවත්, සංස්ථාවේ වාහන ලේඛනයේ අංක දෙකක් යටතේ වාහන දෙක බැගින් ඇතුළත්ව තිබූ බවත් කාරක සභාවට හෙළි විය.

විගණනයට ඉදිරිපත් වී ඇති තොරතුරුවලට අනුව මෙම ගැටළුව යතුරුපැදි හේතුවෙන් පමණක් සිදු වී නොමැති බවත්, මෝටර් ලොරි සහ කාර් සම්බන්ධයෙන්ද ගැටළු පවතින බවත් කාරක සභාවට නිරීක්ෂණය විය.

වාහන පිළිබඳ මෙම පරස්පරතාව සම්බන්ධයෙන් සම්පූර්ණ තොරතුරු ඇතුළත් වාර්තාවක් කාරක සභාව වෙත නොපමාව ඉදිරිපත් කරන ලෙසට කරන ලද නිර්දේශයට අනුව, සංස්ථාවේ සභාපති විසින් මේ සම්බන්ධයෙන් 2025.08.21 දිනැතිව සකස් කර ඇති වාර්තාව පරිසර අමාත්‍යාංශයේ ලේකම්ගේ 2025.09.10 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. රජයේ විගණන අංශය විසින් වාහන 116ක් පිළිබඳව ඉදිරිපත් කරන ලද පරිසර අමාත්‍යාංශයේ ලේකම්ගේ 2025.09.10 දිනැති ලිපිය මගින් මේ සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇති අතර, වාහන 116 පිළිබඳ රජයේ විගණන අංශය විසින් ඉදිරිපත් කරන ලද විගණන විමසුමට අදාල පැහැදිළි කිරීම සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ලේඛනයේ පවතින නමුත් රාජ්‍ය දැව සංස්ථාවේ වාහන ලේඛනයේ වාහන 134ක් සඳහන් නොවීම සම්බන්ධයෙන් වන පැහැදිලිකිරීමද සිදු කොට ඇත.